# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2222/68 - 2021 අප්‍රේල් මස 09 වැනි සිකුරාදා - 2021.04.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/31.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

ජනාධිපති විධානය

1. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා, පා.ම.
   තරුණ හා ක්‍රීඩා අමාත්‍ය
2. ගරු නිමල් ලාන්සා මැතිතුමා, පා.ම.
   ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය
3. ගරු දිලුම් අමුණුගම මැතිතුමා, පා.ම.
   වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය
4. ගරු කංචන විජේසේකර මැතිතුමා, පා.ම.
   විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය
5. ගරු සීතා අරඹෙපොල මැතිතුමිය, පා.ම.
   නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය
6. ගරු චන්න ජයසුමන මැතිතුමා, පා.ම.
   ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය
7. ගරු කාදර් කාදර් මස්තාන් මැතිතුමා, පා.ම.
8. ගරු කපිල අතුකෝරල මැතිතුමා, පා.ම.
9. ගරු සංජීව එදිරිමාන්න මැතිතුමා, පා.ම.

1A - G 33906 — 425 (2021/04)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

10. ගරු නිපුණ රණවක මැතිතුමා, පා.ම.
11. ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා, පා.ම.
12. ගරු ටිරාන් අලස් මැතිතුමා, පා.ම.
13. ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා, පා.ම.
14. ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මැතිතුමා, පා.ම.
15. ගරු චින්තක අමල් මායාදුන්නේ මැතිතුමා, පා.ම.
16. ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මැතිතුමා, පා.ම.

වෙත,

ශුභාශිංසන පූර්වකවයි!

සෞභාග්‍යයේ දැක්ම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි දක්වා ඇති පරිදි ග්‍රාමීය ආර්ථිකය තුළින් බලගැන්වුණු ජනතා කේන්ද්‍රීය ආර්ථික සංවර්ධනයකට ප්‍රවේශ වීමේ ජනතා අභිලාෂයන් සපුරාලීම සඳහා බිම් මට්ටමේ ප්‍රජාවගේ මූලික ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් දීම සඳහා සක්‍රීය හා සජීවී යාන්ත්‍රණයක අවශ්‍යතාවය හඳුනාගෙන ඇති බැවින් ද,

ප්‍රාදේශීය වශයෙන් පවතින භූ විද්‍යාත්මක, පාරිසරික, සංස්කෘතික, සාමාජීය හා ආර්ථික විෂමතාවයන් බිම් මට්ටමෙන් හඳුනා ගෙන, එකී විෂමතාවයන් හේතුවෙන් පසුබෑමට ලක්වන ග්‍රාමීය ප්‍රදේශවලට නව අවස්ථා නිර්මාණය කරමින්, ග්‍රාමීය ආර්ථික සංවර්ධනය ඉලක්ක කරගත් "ගම සමග පිළිසඳර" රජයේ ප්‍රමුඛ වැඩසටහනෙහි ක්‍රියාත්මක අදියර මේ වන විට ශ්‍රී ලංකාව පුරා දියත් වන බැව් සැලකිල්ලට ගනිමින් ද,

එකී වැඩසටහන රජයේ ඉලක්ක හා ජනතා අවශ්‍යතාවන් හා සමපාත කරමින්, අරමුණුගත, නිශ්චිත ප්‍රථිඵල කරා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස මෙහෙයවීම හා පසුවිපරම් කිරීම අත්‍යවශ්‍ය කරුණක් බව අවධානයට ගනිමින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්‍ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ඔබතුමන්ලා, එනම්,

1. ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා, පා.ම.
   තරුණ හා ක්‍රීඩා අමාත්‍ය
2. ගරු නිමල් ලාන්සා මැතිතුමා, පා.ම.
   ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍ය
3. ගරු දිලුම් අමුණුගම මැතිතුමා, පා.ම.
   වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය
4. ගරු කංචන විජේසේකර මැතිතුමා, පා.ම.
   විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍ය
5. ගරු සීතා අරඹේපොල මැතිතුමිය, පා.ම.
   නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍ය
6. ගරු චන්න ජයසුමන මැතිතුමා, පා.ම.
   ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය
7. ගරු කාදර් කාදර් මස්තාන් මැතිතුමා, පා.ම.
8. ගරු කපිල අතුකෝරල මැතිතුමා, පා.ම.
9. ගරු සංජීව එදිරිමාන්න මැතිතුමා, පා.ම.
10. ගරු නිපුණ රණවක මැතිතුමා, පා.ම.
11. ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා, පා.ම.
12. ගරු ටිරාන් අලස් මැතිතුමා, පා.ම.
13. ගරු ගෙවිඳු කුමාරතුංග මැතිතුමා, පා.ම.
14. ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මැතිතුමා, පා.ම.
15. ගරු චින්තක අමල් මායාදුන්නේ මැතිතුමා, පා.ම.
16. ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මැතිතුමා, පා.ම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගම සමග පිළිසඳර ග්‍රාමීය සංවර්ධන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන්, මතු දැක්වෙන කාර්යයන් ඉටු කිරීම පිණිස මෙයින් පත්කරමි.

1. ගම සමග පිළිසඳර වැඩසටහනේ දී ජනතාව විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්ණ හා ගැටළු සම්බන්ධයෙන් ම විසින් දෙන උපදෙස් හා නියෝග කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් සියළුම ආයතන ප්‍රධානීන් ද ඇතුළුව, ප්‍රාදේශීය මට්ටමේ සියළුම නිලධාරීන් සේවා අවශ්‍යතාවයන් අනුව මෙහෙයවීම,

2. ගම සමග පිළිසඳර කේන්ද්‍රකරගත් ග්‍රාමීය සංවර්ධන කටයුතු ප්‍රාදේශීය මට්ටමේ දී ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය නිරන්තරයෙන් සොයා බලා ජනතා අපේක්ෂාවන් ඉටුවන ආකාරයෙන් එකී වැඩසටහන් කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම,

3. සෑම ගමක්ම ආවරණය වන පරිදි පත්කර ඇති ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය), කෘෂි පර්යේෂණ සහකාර (ගොවිජන සේවා දෙපාර්තමේන්තුව), සමෘද්ධි සංවර්ධන නියාමකවරුන් හා නිලධාරීන් (සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව), පවුල් සෞඛ්‍ය නිලධාරීන් (සෞඛ්‍ය දෙපාර්තමේන්තුව), නේවාසික මට්ටමේ ව්‍යාපෘති, තාක්ෂණික හා උපදේශක සේවා සැපයීම සඳහා යෙදවීමට කටයුතු කිරීම,

4. ප්‍රාදේශීය සභා හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික මට්ටමේ රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරන මාර්ග, පානීය ජල සම්පාදන, විදුලිය, දුරකථන සන්නිවේදන, ක්‍රීඩා පිටි, පාසැල්, රෝහල්, වෘත්තීය අධ්‍යාපන ආයතන, නාගරික විශ්වවිද්‍යාල, ඉඩම් පැවරීම්, බැංකු හා මූල්‍ය පහසුකම්, වෙළෙඳපළ, ගබඩා හා යටිතල පහසුකම් වැනි 2021 - 2023 අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති කඩිනම් කිරීම,

5. රාජ්‍ය ආයෝජන වැඩපිළිවෙල යටතේ දේශීය හා විදේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක වන සියලු ව්‍යාපෘති කඩිනමින් ඉලක්කගත කාලසීමාවන් තුළ ප්‍රමිතියෙන් යුතුව ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම,

6. නේවාසික ඉඩම්වල නිවාස හා සනීපාරක්ෂක කටයුතු, එම භූමිවල එළවළු, පළතුරු, පොල්, කොස්, දෙල් වැනි භෝග වගා කිරීම මගින් නේවාසික ආර්ථිකය ශක්තිමත් කිරීම,

7. අවශ්‍ය ප්‍රතිපාදන ක්‍රමවත් ලෙස ලබාදීම සඳහා අයවැය දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය සඳහා භාණ්ඩාගාර ලේකම් හෝ ඔහු විසින් බලය පවරනු ලබන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු සමග අයවැය ප්‍රතිපාදන කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම හා මගපෙන්වීම,

8. බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය විසින් අඩු ආදායම්ලාභීන් සඳහා රැකියා ලබාදීමට අවශ්‍ය කාර්යය මණ්ඩල අවශ්‍යතා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති බැවින් බිම් මට්ටමේ සංවර්ධන කටයුතු වලට අවශ්‍ය කාර්යය මණ්ඩල බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකාය මගින් අදාළ ප්‍රදේශවලින් යොදා ගන්නා ශ්‍රමිකයන් ඵලදායී ලෙස ග්‍රාමීය සංවර්ධනය, පාසැල් හා රෝහල්, ග්‍රාමීය මාර්ග, ප්‍රාදේශීය සභා, සති පොළවල් පවිත්‍ර කිරීමේ කටයුතු, අලි වැට සකස් කිරීම් හා නඩත්තු කිරීම් වැනි කටයුතු සඳහා යොදා ගැනීම හා අධීක්ෂණය සඳහා උපදෙස් හා මගපෙන්වීම,

තව ද, තරුණ හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා පූර්වෝක්ත කාර්ය සාධක බලකායේ සභාපති වශයෙන් මම මෙයින් පත් කරමි.

තවද, මෙම ජනාධිපති කාර්ය සාධක බලකාය වෙතින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයිද, ලබාදිය යුතු සියළුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියළුම තොරතුරු ලබාදිය යුතු යැයිද මම මෙයින් සියළුම නිලධරයන්ට හා සෙසු තැනැත්තන්ට නියම කොට විධානය කරමි.

තවද, කිසියම් රාජ්‍ය සේවකයෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එබඳු ආයතනයක නිලධාරියෙකු විසින් පෙර කී කාර්ය සාධක බලකාය විසින් පවරන ලද රාජකාරි ඉටු කිරීම ප්‍රමාද කිරීමේ, පැහැර හැරීමේ අවස්ථා මා හට වාර්තා කරන ලෙස පෙරකී කාර්ය සාධක බලකායට මම මෙයින් නියම කොට විධාන කරමි.

ජනාධිපති අතිරේක ලේකම්, චන්දිමා වික්‍රමසිංහ මෙනවිය විසින් "ගම සමග පිළිසඳර" ග්‍රාමීය සංවර්ධන කටයුතු හා සම්බන්ධිත අවශ්‍ය සියළු තොරතුරු ලබා දෙමින්, අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කරනු ඇත.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ අප්‍රේල් මස 09 වැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී. බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.